# සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 1.2.1, 1.2.3 හා 1.2.4 ඡේදවල දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2012 වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කමිටු දීමනා රු. 91,800 ක් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 11 ක් වටා වැටවල් ඉදි කිරීමේ ව්‍යාපෘතිය

(i) කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රු.9,359,784 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලින් 2012 වර්ෂයේදී පියවා ගත් අත්තිකාරම් ප්‍රමාණය රු.3,335,283 ක් වුවද එය රු.2,668,226 ක් ලෙස ගිණුම් ගත කිරීම නිසා රු.667,057 කින් අත්තිකාරම් ගිණුමේ ශේෂය වැඩියෙන් දක්වා තිබුණි.

(ii) කොන්ත්‍රාත්කරුට ගෙවන ලද පළමු බිල්පත් 6 හි වටිනාකම වූ රු.16,676,415 ක් කෙරිගෙන වැඩ ගිණුමේ හා කොන්ත්‍රාත්කරුගේ ගිණුමේ සටහන් කළයුතු වුවද එය රු.13,341,132 ක් ලෙස සටහන් කිරීම නිසා රු.3,335,283 කින් එම ගිණුම් අඩුවෙන් දක්වා තිබුණි.

**1.2.2 ලැබිය යුතු ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(ආ) 2010 වර්ෂයේදී පුද්ගලයින් 05 දෙනෙකු වෙත ණය පදනම මත ලබා දී තිබුණු රු.1,723,450 ක් වටිනා ත්‍රීවිල් 5 ක වටිනාකම මාසික වාරික 48 කින් ගෙවා අවසන් කළ යුතු අතර 2012 දෙසැම්බර් 31 වන විට අයකර ගත යුතු මුළු ණය වාරිකවල වටිනාකම රු.896,194 ක් වුවද අයකර ගෙන තිබූ වාරිකවල වටිනාකම රු. 538,398 ක් පමණක් විය.

(ආ) ස්වයං රැකියා සහ ව්‍යවසායකත්ව වැඩසටහන යටතේ 2009 වර්ෂයේදී ප්‍රතිලාභීන් 74 ක් දෙනෙක් වෙත ලබා දී තිබුණු රු.2,700,000 ක ණය මුදලින් සමාලෝචිත වර්ෂය අවසානයට රු. 1,500,550 ක වාරික හිගහිට තිබුණි.

(ඇ) වැවිලි මානව සංවර්ධන භාරය විසින් 2008 වර්ෂයේ පැවැත්වූ උත්සවයක් සඳහා ඉන්දියාවෙන් පොත් ආනයනය කිරීමේදී එම භාරය විසින් ගෙවියයුතු රු.90,577 ක් පදනම විසින් ගෙවා තිබූ අතර එම මුදල් 2013 දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගැනීමට කටයුතු කර ගෙන නොතිබුණි.

**1.2.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ගිණුම් විෂයයන් සංනිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| විස්තරය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි - පිරිවැය | 347,402,548 | (i) හිමිකාරත්වය තහවුරු කරන ලියවිලි<br>(ii) ස්ථාවර වත්කම් ලේඛනය<br>(iii) භාණ්ඩ සමීක්ෂණ වාර්තා<br>(iv) උපලේඛන |
| ජංගම නොවන වත්කම් | 129,778,194 | (i) ස්ථාවර වත්කම් ලේඛනය<br>(ii) භාණ්ඩ සමීක්ෂණ වාර්තා<br>(iii) උපලේඛන |
| කාන්තා දින වැඩසටහන වෙනුවෙන් අත් බෑග් 1250 ක් මිලදී ගැනීම | 812,500 | (i) තොග ලේඛනය<br>(ii) බෙදා දී ඇති ආකාරය හා නාම ලේඛනය |

| | | |
|---|---|---|
| V - Set පද්ධතිය හා අන්තර්ජාල පහසුකම් සැපයීමේ ගාස්තු | 5,213,760 | අදාල සමාගම සමඟ ඇතිකරගත් ගිවිසුම |
| කාන්තා දින වැඩසටහනේ ප්‍රවාහන ගාස්තු | 819,703 | (i) ප්‍රවාහනය කළ මගීන් සංඛ්‍යාව<br>(ii) සේවාව ලබා ගත් බවට වගකිව යුතු නිලධාරියෙකුගේ සහතිකය<br>(iii) ධාවනයට යොදා ගත් දිනය හා ධාවනය කළ දුර |

## 1.2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම

| නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) (i) 2005 අංක 19 දරන සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනතෙහි 10 වගන්තියේ 2,3,4 ඡේද | ස්වකීය බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේදී දරන සියලු වියදම් පදනම ගොඩ නගා ගත් අරමුදලින් දැරිය යුතු වූවත්, සියලු වියදම් අමාත්‍යාංශයන් ප්‍රතිපූර්ණය කරගැනීම මගින් පමණක් පදනම කාර්යයන් ක්‍රියාත්මක කර තිබුණි. |
| (ii) 1971 අංක 38 දරන මුදල් පනතේ 10 (5) වගන්තිය | බැංකු අයිරා පහසුකම් සඳහා මුදල් අමාත්‍යවරයාගේ හා අදාල අමාත්‍යවරයාගේ එකඟත්වය ලබා නොගෙන රු.5,309,579 ක බැංකු අයිරා පහසුකම් ලබා ගෙන තිබුණි. |
| (iii) 1958 දෙසැම්බර් 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ II කොටසේ 10 (1) හා (2) ඡේද | 2012 වර්ෂයේ පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා සේවකයාගේ වැටුපෙන් අයකර ඇති දායක මුදල හා සේව්‍යයාගේ දායක මුදලේ එකතුව වූ රු.1,015,811 ක් සේවක අර්ථසාධක අරමුදල වෙත ගෙවා නොතිබුණි. |
| (iv) 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනතේ II කොටසේ 16 i වන වගන්තිය | සේවක භාරකාර අරමුදලට දායක මුදල් ප්‍රේෂණය කිරීම ප්‍රමාද වීම නිසා රු.61,886 ක අධිභාර ගෙවීමට සිදු වී තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 188 හා 323(1) හා (2) | ප්‍රජාශක්ති මධ්‍යස්ථානවල වියදම් පියවීම සඳහා හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මාසික දීමනා ගෙවීම සඳහා රු.16,005,017 ක මුදලක් ප්‍රජාශක්ති / නවශක්ති ව්‍යාපෘති භාර නිලධාරීන් දෙදෙනෙකුගේ පෞද්ගලික බැංකු ගිණුම් 2 කට බැර කර තිබුණි. |
| (ඇ) | (i) 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | (ii) 2007 අගෝස්තු 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 9/2007 (1) හි අංක (i) හා (iv) ඡේද | වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරීන් 5 දෙනෙකු විධිමත් අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවාගෙන දීමනා ලෙස රු.2,487,600 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |
| | (iii) 2000 ජුනි 27 දිනැති අංක PE/PE/09 රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2009 වර්ෂයේදී වියදම් ප්‍රතිපූර්ණය සඳහා අමාත්‍යාංශයෙන් ලැබුණු මුදල් වලින් රු.4,200,000 ක් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණු නමුත් ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| | (iv) 2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 | චක්‍රලේඛ ප්‍රකාරව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි අනුමත කරගෙන නොතිබුණි. |
| (ඈ) | 2011 ජනවාරි 01 දිනැති ප්‍රසම්පාදන අත්පොතේ 20 වැනි අතිරේකයෙහි ii ඡේදය | 2012 වර්ෂයේදී රු.3,732,100 ක හදිසි මිලදී ගැනීමක් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සිදුකර තිබුණු නමුත් ඒ සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ඉ) | 2008 දෙසැම්බර් 29 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 102 | තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ හා නෝවුඩ් ක්‍රීඩා සංකීර්ණයේ ආරක්ෂක සේවයට දිනකට අනුමත වැඩමුර සංඛ්‍යාව ඉක්මවා සේවයේ යොදවා ගෙන තිබීම නිසා එම මධ්‍යස්ථාන සඳහා වෙන් වූ අනුමත වියදම් සීමාව ඉක්මවා රු.3,147,050 ක ආරක්ෂක වියදමක් දරා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ පදනමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.54,307,157 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.38,064,921 ක් විය. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ රු.16,242,236 කින් ඌණතාවය වැඩි වී තිබූ අතර වර්ෂයේ සමස්ථ වියදම රු.20,117,042 කින් වැඩි වීම ඊට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ විවිධ අධියරයන් පහත පරිදි විය.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | විචලනය | විචලනයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | 2012 වර්ෂය | 2011 වර්ෂය | | |
| | රු. | රු. | රු. | % |
| ආදායම | 106,342,779 | 102,467,975 | 3,874,804 | 4 |
| වියදම | 111,758,945 | 100,942,326 | 10,816,619 | 11 |
| වාර්ෂික ක්ෂය හා හිලව් වියදම් ගැලපීමට පෙර ලාභය / අලාභය | (5,416,165) | 1,525,649 | (6,941,814) | 554 |
| වාර්ෂික ක්ෂය හා හිලව් වියදම | 48,890,992 | 39,590,569 | 9,300,423 | 24 |
| වාර්ෂික ක්ෂය හා හිලව් වියදම ගැලපූ පසු ලාභය /අලාභය | (54,307,157) | (38,064,921) | (16,242,236) | 43 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පදනම යටතේ ක්‍රියාත්මක වන ආයතනවල කාර්යසාධනය පහත පරිදි විය.

(i) ප්‍රජාශක්ති හා නවශක්ති ව්‍යාපෘතිය යටතේ පුද්ගලයින් 45,000 ට තොරතුරු තාක්ෂණ පුහුණුව හා තරුණයින් 200 ට රැකියා අවස්ථා ලබාදීම සඳහා රු. මිලියන 80. 5 ක් වැය කිරීමට සැලැසුම් කර තිබුණද පුද්ගලයින් 32,556 ට තොරතුරු තාක්ෂණ පුහුණුව හා තරුණයින් 36 දෙනෙකුට රැකියා ලබාදීම සඳහා රු. මිලියන 66.07 ක් වැයකර තිබුණි.

(ii) තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානයේ පුහුණුව සඳහා එක් පුහුණු ලාභියෙකු වෙනුවෙන් රු.38,750 ක් බැගින් පුහුණු ලාභීන් 240 දෙනෙකු සඳහා රුපියල් මිලියන 9.3 ක් **ඇස්තමේන්තු** කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ ප්‍රතිලාභීන් 60 දෙනෙකු සඳහා රු.මිලියන 7.97 ක් වැයකර තිබීම නිසා එක් අයෙකු වෙනුවෙන් දරන ලද තත්‍ය වියදම ඇස්තමේන්තු වියදම ඉක්මවා රු. 94,083 කින් වැඩි වී තිබුණි. වසර අවසාන වනවිට ඉන් තවදුරටත් පුහුණුව ලබමින් සිටි පුහුණුලාභීන් සංඛ්‍යාව 38 දක්වා අඩු වී තිබුණි.

(iii) නෝවුඩ් ක්‍රීඩා සංකීර්ණය විසින් රු. මිලියන 3.6 ක් වැය කර සමාලෝචිත වර්ෂය තුල තරුණයින් 1000 ට ක්‍රීඩා පහසුකම් සැපයීමට සැලසුම්කර තිබුණද රු. මිලියන 1.99 වැයකර තරුණයින් 83 දෙනෙකුට පමණක් ක්‍රීඩා පහසුකම් සපයා තිබීම නිසා එක් තරුණයෙකු වෙනුවෙන් දරන ලද තත්‍ය වියදම ඇස්තමේන්තුගත වියදම ඉක්මවා රු.20,376 කින් වැඩි වී තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

ප්‍රජාශක්ති මධ්‍යස්ථාන පිහිටුවා ඇති ඉඩම්, පදනමට පවරා ගැනීමට ඉඩම් මැනීම සඳහා 2012 වර්ෂය දක්වා රු. 2,319,298 ක වියදමක් දරා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයේදීද මනින ලද ඉඩම් පදනම වෙත පවරා ගෙන නොතිබුණි.

## 3.3 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පදනමේ වියදම් ප්‍රතිපූර්ණය සඳහා අමාත්‍යාංශයෙන් ලැබෙන චෙක්පත්, බැංකු හරහා මිලදී ගැනීම මගින් (Cheque Purchasing) මුදල් කර ගැනීම නිසා රු.532,789 ක අතිරේක වියදමක් දැරීමට සිදු වී තිබුණි.

(ආ) දුප්පත් දරුවන් අතර බෙදා හැරීම සඳහා අභ්‍යාස පොත් 120,000 ක් මිලදී ගැනීම සඳහා රාජ්‍ය ආයතනයකට සමාලෝචිත වර්ෂයේ ලබා දී තිබුණු රු. 2,000,000 ක අත්තිකාරම් මුදලට අදාලව පොත් 26,841 ක් 2013 ජනවාරි මාසයේ ලැබී තිබුණද එම පොත් 2013 ඔක්තෝබර් මාසය දක්වා දරුවන් අතර බෙදාදීමට කටයුතු කර නොතිබුණි.

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු - රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මධ්‍යස්ථාන පරිශ්‍රයේ රු.9,591,320 ක් වටිනා අභ්‍යන්තර මාර්ග ඉදි කිරීම හා කාපට් කිරීම සඳහා ගිවිසුමකට එළඹීමකින් තොරව 2012 ඔක්තෝබර් 11 වන දින රු.1,918,264 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාල කාර්යයන් ආරම්භ කර නොතිබුණි. අත්තිකාරම් ඇපකරයේ වලංගු කාලය 2013 මාර්තු 17 අවසන්ව තිබුණද එම අත්තිකාරම් මුදල පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මධ්‍යස්ථානයේ ක්‍රීඩා පිටිය, දැල්පන්දු, අත්පන්දු හා පැසිපන්දු පිටි සැකසීමේ කාර්යය සඳහා රු.8,501,568 ක් වටිනා කොන්ත්‍රාත් ගිවිසුමකට 2011 දෙසැම්බර් 26 දින එළඹ තිබුණු අතර වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් හා පලමු ගෙවීම වශයෙන් රු.3,700,313 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලැබී දින 07 කින් වැඩ ආරම්භකර මාස 06 කින් අවසන් කලයුතු වුවද, නිසි අධිකාර බලයකින් තොරව පදනමේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මූල්‍ය විසින් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණද විගණන දිනය වන 2013 ඔක්තෝබර් 13 දිනවන විටද එම කාර්යය අවසන් කර නොතිබුණි. මේ සඳහා කාර්යසාධන ඇපකරයක් ලබාගෙන නොතිබුණු අතර ලබා ගෙන තිබුණු අත්තිකාරම් ඇපකරයේ වලංගු කාලයද 2012 නොවැම්බර් අවසන් වී තිබුණද එය අලුත් කරවාගෙන නොතිබුණි.

එසේම 2012 අගෝස්තු 13 දිනෙන් පසු කොන්ත්‍රාත් කාර්යයන් ඉටුකර නොමැති මෙම කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් පදනම විසින් ගෙන නොතිබුණි.

(ඇ) 2010 වර්ෂයේ ගිවිසුම් අත්සන් කර 2011 මාර්තු 15 දින අවසන් කිරීමට නියමිතව තිබුණු ගොඩනැඟිලි සඳහා ජල සැපයීම සඳහා වූ රු.2,236,883 ක් වටිනා කොන්ත්‍රාත්තුවේ 2012 දෙසැම්බර් 31 දිනට කල වැඩ වටිනාකම රු.743,647 ක් වුවද, ඊට අදාල විගණන කටයුතු සඳහා අදාල ලිපි ගොනුව විගණනයට ඉදිරිපත් නොවීය.

(ඈ) 2010 වර්ෂයේ ගිවිසුම් අත්සන් කර 2011 සැප්තැම්බර් 30 දින අවසන් කිරීමට නියමිතව තිබුණු පිරිමි නේවාසිකාගාරය ඉදි කිරීම සඳහා වූ රු.23,713,083 ක් වටිනා කොන්ත්‍රාත්තුවේ 2012 දෙසැම්බර් 31 දිනට කල වැඩ වටිනාකම රු. 8,590,462 ක් වූ අතර 2013 අප්‍රේල් 29 දිනැති පදනමේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) ගේ ලිපිය අනුව 2011 නොවැම්බර් මාසයෙන් පසු මෙම කොන්ත්‍රාත්තුවේ කාර්යයන් ඉටු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. ඊට අදාල විගණන කටයුතු සඳහා අදාල ලිපි ගොනුව විගණනයට ඉදිරිපත් නොවීය.

(ඉ) මධ්‍යස්ථානයට ජල මූලාශ්‍ර ආශ්‍රයෙන් ජල සැපයුම් පද්ධතියක් ඉදි කිරීම සඳහා රු. 1,787,925 ක් වටිනා කොන්ත්‍රාත්තු ගිවිසුමකට එළඹ තිබුණු නමුත් පදනමේ සභාපති විසින් ඊට අත්සන් තබා ගිවිසුම වලංගු කර නොතිබුණි. එම ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත් කාලය මාසයක් වන අතර නිසි අධිකාර බලයකින් තොරව පදනමේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) විසින් අවස්ථා දෙකකදී ගිවිසුම් කාලය දීර්ඝ කර තිබුණද විගණන දිනය වන 2013 ඔක්තෝබර් 10 දින වන විටද කොන්ත්‍රාත් කාර්යයන් ආරම්භ කර නොතිබුණි. එම කොන්ත්‍රාත්කරු වෙත රු.357,585 ක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් ගෙවා තිබුණද අත්තිකාරම් ඇපකරයේ වලංගු කාලය 2012 අගෝස්තු 20 දින අවසන් වී තිබූ අතර එය අලුත් කරවා ගැනීමට හෝ අත්තිකාරම් මුදල පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

(අ) පදනමේ ප්‍රධාන කාර්යාලය සඳහා අනුමත කාර්යය මණ්ඩලයට ඇතුලත් වී නොතිබුණු තනතුරු දෙකක් සඳහා නිලධාරීන් දෙදෙනෙකු කොන්ත්රාත් පදනම මත බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේ රු.1,452,000 ක් දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සඳහා කාර්යය මණ්ඩලය හා වැටුප් ක්‍රම අනුමත කරගෙන නොතිබුණි.

(ඇ) ප්‍රජාශක්ති ව්‍යාපෘතිය සඳහා 2011 වර්ෂයේදී අනුමත කර තිබුණු කාර්යය මණ්ඩලය හා වැටුප් ක්‍රමය අනුව අදාල තනතුරු වලට සුදුස්සන් බඳවා ගෙන නොතිබුණු නමුත් 2006 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරියෙකු 2012 වර්ෂය අවසානය දක්වාම සේවයේ යොදවාගෙන සමාලෝචිත වර්ෂයේදී රු. 480,000 ක වාර්ෂික වැටුපක් ගෙවා තිබුණි.

(ඈ) 2012 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුක්තු **ක්ෂේත්‍ර සම්බන්ධීකාරවරුන්** 90 දෙනෙකු සඳහා , 2010 සිට 2012 වර්ෂය දක්වා රු. 18,157,500 ක දීමනා ගෙවා තිබුණි. ඔවුන්ගේ කළ වැඩ වාර්තා අනුව එම නිලධාරීන්ගෙන් පදනම වෙත ලද ප්‍රතිලාභ පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 ගිණුම් ඉදිරිපත් කිරීම

අංක පීඊඩී 12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය ඉකුත්වී දින 60 ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් පදනම විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 07 ක් ප්‍රමාද වී 2013 සැප්තැම්බර් 23 දින ඉදිරිපත් කර තිබුණි.

### 4.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා පදනම විසින් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

වර්ෂය තුල අභ්‍යන්තර විගණන අංශය ක්‍රියාත්මක වී නොතිබුණි.

### 4.4 විගණන කළමනාකරණ කමිටු

අංක පීඊඩී 12 හා 2003 ජුනි 02 දිනැති පොදු ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

### 4.5 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා පදනම විසින් පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව කටයුතු කර නොතිබුණි.

### 4.6 අයවැය පාලනය

අයවැය දත්ත හා තථ්‍ය දත්ත අතර විචලනයේ ප්‍රතිශතය 21% සිට 455% දක්වා වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

### 4.7 වාර්ෂික වාර්තා ප්‍රසිද්ධ කිරීම

පදනම ආරම්භකල 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

**-------------------**

**විගණනයේදී නිරීක්ෂණය ව පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතුය.**

(අ) කොන්ත්‍රාත් පරිපාලනය

(ආ) සේවක මණ්ඩල පරිපාලනය

(ඇ) මූල්‍ය පාලනය

(ඈ) අයවැය පාලනය

(ඉ) වත්කම් පරිපාලනය

(ඊ) ලැබියයුතු ගිණුම්

(උ) කාර්යසාධනය